# 16 සහෝදර ප්‍රේමය



16.1 - රූපය ප්‍රීතියෙන් සිටින පවුලක්

පවුල, පාසල හා සමාජය තුළ සිටින විවිධ අය සමඟ සතුටින් සමගියෙන් ජීවත් වන්නට අප කවුරුත් කැමතියි. එලෙස සතුටින් පිරුණු ජීවිතයක් ගත කරන්නට නම්, අප එකිනෙකාට ගරු කළ යුතු ය. අන් අයගේ ජීවිත උසස් කොට සලකන්නට පුරුදු විය යුතු ය.

එවැනි ප්‍රීතිමත් සමාජයක් ගොඩනැංවීමට දස පනතේ ඉගැන්වීම් තුළින් ලැබෙන මග පෙන්වීම අපි දැන් විමසා බලමු. අසල්වැසියාට ප්‍රේමය දැක්වීමට උගන්වන දේව පනත් හතක් තිබේ. එනම්, හතරවන පනතේ සිට දහවන පනත දක්වා වන දේව පනත් හත යි.

## හතරවන දේව පනත - මව්පියන්ට සංග්‍රහ කරව

නුඹේ පියාට ද මවට ද ගෞරව කරව. එවිට නුඹේ දෙවි සමිඳාණන් වහන්සේ නුඹට දෙන රටේ බොහෝ කාලයක් ජීවත් වන්නෙහි ය.

නික්මයාම 20:12

දරුවෙනි, සියලු කාරණාවල දී දෙමව්පියන්ට කීකරු වන්න. මන්ද, ඔබ එසේ කිරීම ස්වාමින් වහන්සේට ප්‍රීතියකි.

(කොලොස්සි 3:20)

## පස්වන දේව පනත - ජීවිත විනාශ නොකරව

මිනී නොමරන්න.

(නික්මයාම 20:13)

මිනී නොමරන්න. මිනී මරන කවරකු වුව ද විනිශ්චයට යටත්වනු ඇතැ'යි පැරැන්නන්ට කී බව ඔබ අසා ඇත.

(මතෙව් 5:21)

## හයවන දේව පනත - කාම මිථ්‍යාචාරය නොකරව

කාම මිථ්‍යාචාරය නොකරව.

(නික්මයාම 20:14)

ඔබගේ ශරීරය, ඔබට දෙවියන් වහන්සේ දෙවා වදාළ, ඔබ තුළ වැඩ වසන ශුද්ධාත්මයාණන්ගේ මන්දිරය වන බව ඔබ නොදන්නාහු ද? ඔබ ඔබට ම අයිති නැත. ඔබ මිලයකට ගත් අය වන්නහු ය. එබැවින් ඔබගේ ශරීර දේව මහිමය සඳහා යොදවන්න. (1 කොරින්ති 6:19-20)

- හත්වන දේව පනත - සොරකම් නොකරව

සොරකම් නොකරව (නික්මයාම 20:15)
සොරුවත් කොල්ල කන්නෝවත් ලෝබයෝ වත් බේබද්දෝවත් නින්ද කරන්නෝවත් ගසා කන්නෝවත් දෙවියන් වහන්සේගේ රාජ්‍ය උරුම කර නොගන්නෝ ය.

(1 කොරින්ති 6:10)

- අටවන දේව පනත - බොරු සාක්ෂි නොකියව

නුඹේ අසල්වැසියාට විරුද්ධ ව බොරු සාක්ෂි නොකියව.
(නික්මයාම 20:16)

එබැවින් බොරු කීම අත්හැර දමා අසල්වාසී එකිනෙකා සමග සත්‍යය කතා කරන්න. මන්ද, අපි එකිනෙකා අන්‍යෝන්‍ය අවයවයෝ වෙමු.

(එපීස 4:25)

- නවවන දේව පනත - පරදූර ආලය නොකරව

නුඹේ අසල්වැසියාගේ භාර්යාවට ..... ඇලුම් නොකරව.

(නික්මයාම 20:17)

- දහවන දේව පනත - අන් වස්තු ආශා නොකරව

නුඹේ අසල්වැසියාගේ ගෘහයට නුඹ ඇලුම් නොකරව ........ ඔහුගේ සේවකයාට හෝ සේවිකාවට හෝ ඔහුගේ ගවයාට හෝ කොටළුවාට හෝ නුඹේ අසල්වැසියා සතු වෙනත් කිසිවකට හෝ ඇලුම් නොකරව.

(නික්මයාම 20:17)

ඉහත දැක්වෙන දේව පනත්වලට අනුකූල ව අපගේ ජීවිත ගොඩනගා ගන්නේ නම්, අප ජීවත් වන සමාජය හැම කෙනකුට ම ප්‍රීතිය හා සාමය ඇති තැනක් වනු ඇත. බියෙන් සැකෙන් තොර ව හැම කෙනකුට ම ජීවත් වීමට හැකිවනු ඇත. එබැවින් මෙම ප්‍රේමයේ දේව පනත් ක්‍රියාවට නැංවීමේ දී අප විසින් කළ යුතු හා නොකළ යුතු දේ පිළිබඳ ව විමසා බලමු.

| දේව පනත | කළ යුතු දේ | නොකළ යුතු දේ |
|---|---|---|
| හතරවන දේව පනත<br>මව්පියන්ට සංග්‍රහ කරව | ★ දෙමව්පියන්, වැඩිහිටියන් හා ශ්‍රේෂ්ඨයින්ට ගරු කිරීම<br>★ දෙමව්පියන්ගේ හා වැඩිහිටියන්ගේ අවවාද අනුශාසනා පිළිපැදීම<br>★ තම යාච්ඤාවල දී දෙමව්පියන් හා වැඩිහිටියන් වෙනුවෙන් යාච්ඤා කිරීම<br>★ ඔවුන්ට ආදරයෙන් හා කරුණාවෙන් සැලකීම | ★ වැඩිහිටියන්ට අකීකරු වීම<br>★ වැඩිහිටියන් සමග වෛරයෙන් හා ක්‍රෝධයෙන් වාද කිරීම<br>★ වැඩිහිටියන් වේදනාවට පත් වන අයුරින් කටයුතු කිරීම<br>★ වැඩිහිටියන්ට හිංසා පීඩා කිරීම හා ඔවුන් විහිළුවට ලක් කිරීම |

| | | |
|---|---|---|
| පස්වන දේව පනත<br><br>ජීවිත විනාශ නොකරව | ★ සෑම ජීවිතයක් ම දෙවි පියාණන් වහන්සේගේ උතුම් තිළිණයක් ලෙස සැලකීම<br>★ තමාගේ මෙන් ම අන් අයගේ ජීවිත රැකගැනීම හා ආරක්ෂා කිරීම<br>★ රෝගී වූ විට නිසි ප්‍රතිකාර ගැනීම | ★ සියදිවි නසා ගැනීම<br>★ අන් අයගේ ජීවිතවලට හෝ ශරීරවලට හානි කිරීම<br>★ ශරීර සෞඛ්‍යයට අහිතකර ආහාර හා මත්ද්‍රව්‍ය භාවිත කිරීම<br>★ කේලාම් කීම<br>★ චරිත ඝාතනය |
| හය හා නව වන දේව පනත්<br><br>කාම මිථ්‍යාචාරය නොකරව<br><br>පරදර ආලය නොකරව | ★ විවාහ ජීවිතය දෙවි පියාණන් වහන්සේගෙන් ලද ශුද්ධ වූ ද ආශිර්වාද ලද්දා වූ ද ජීවිත ක්‍රමයක් බව සිතා කටයුතු කිරීම<br>★ මර්යදාවට අනුකූල ව එනම් අන් අය පාපයට නොපොළඹවන ලෙස ඇඳුම් පැළැඳුම් භාවිතය<br>★ විවාහක පවුල තුළ ප්‍රීතිය හා සාමය ඇති වන ආකාරයට කටයුතු කිරීම | ★ අසභ්‍ය පොත්පත්, චිත්‍රපට හා පින්තූර බැලීම<br>★ ආශාවන්ට වහල් වීම |
| හත්වන සහ දහවන දේව පනත්<br><br>සොරකම් නොකරව | ★ අන් අයගේ දේපළ ආරක්ෂා කිරීම<br>★ වෙළඳ ව්‍යාපාරික කටයුතුවල දී සාධාරණ වීම<br>★ ණයට ගත් දේ නිසි වේලාවට ආපසු දීම | ★ සොරකම් කිරීම<br>★ ධනය හා වස්තුව ලෝභී ලෙස රැස් කිරීම |

| | | |
|---|---|---|
| අන් වස්තු ආශා නොකරව | | ★ අනුන් සතු දේ අයුතු ලෙස හෝ බලයෙන් ගැනීම<br>★ දේපළ නාස්ති කිරීම<br>★ පොදු දේපළ විනාශ කිරීම<br>★ වංචා කිරීම |
| අටවන දේව පනත<br>බොරු සාක්ෂි නොකියව | ★ සැමවිට සත්‍ය කතා කිරීම<br>★ දෙවියන් වහන්සේ මෙන් සත්‍යවාදී වීම | ★ බොරු කීම<br>★ වැරදි තීන්දු ලබා දීම<br>★ අසත්‍ය චෝදනා කිරීම<br>★ තම වරද අන් අය මත පැටවීම<br>★ තම වාසිය තකා සත්‍ය වසන් කිරීම |

පහත සඳහන් ගීතිකාව ගායනා කරන්න.

**පුන ගැයුම :**

සමිඳෙ ඔබෙ කුඩාරමේ - සැරිසරන්නෝ කවුරු දෝ
ඔබේ පිවිතුරු කඳුකරේ - පා තබන්නෝ කවුරුදෝ

1. හිතේ කිළිටක් නැති ව හැසිරෙන්නෝ
යුක්ති සහගත දෙයට හිත දෙන්නෝ
නොවක් හිතකින් ඇත්ත පවසන්නෝ
අනුන් අවමන් දිවෙන් නොකියන්නෝ

2. සොහොයුරන් හට නපුර නොපතන්නෝ
අනුන් හොඳ නම කිළිටි නොකරන්නෝ
සියලු දුසිරිත් කෙරෙන් දුරු වන්නෝ
සුසිරිතට නිරතුරු ව හිත දෙන්නෝ

3. මුදල් දී ගිනි පොළී නොකරන්නෝ
අල්ලසක් ගෙන අනුන් නොපෙළන්නෝ
අහිංසකයන් පෙළා නොතළන්නෝ
නිදොස් අය පිටැ වරද නොතබන්නෝ

3. කුරිරුවන් අත දුරින් දුරලන්නෝ
සමිඳු ජන බුහුමනින් සලකන්නෝ
සමිඳු බාරය පැහැර නොහරින්නෝ
මෙබඳු අයම’ යි වාසනා ලද්දෝ
(කිතුනු ගී 211)

**ක්‍රියාකාරකම**

(1) පහත දැක්වෙන වගන්ති අයත් වන දේව පනතේ අංක, ඉදිරියෙන් ඇති වරහන් තුළ ලියන්න.

| **වගන්තිය** | **අදාළ දේව පනතේ අංකය** |
|---|---|
| i. නොවක් හිතකින් ඇත්ත පවසන්නෝ | (.....) |
| ii. අල්ලසක් ගෙන අනුන් නොපෙළන්නෝ | (.....) |
| iii. අනුන් හොඳ නම කිළිටි නොකරන්නෝ | (.....) |
| iv. නිදොස් අය පිට වරද නොතබන්නෝ | (.....) |
| v. අන් අයගේ වස්තුව ආරක්ෂා කිරීම | (.....) |
| vi. ශ්‍රේෂ්ඨයින්ට ගරු කිරීම | (.....) |
| vii. මර්යදාවට අනුකූල ව ඇඳුම් ඇඳීම | (.....) |
| viii. තම පවුල තුළ ප්‍රීතිය හා සාමය ඇතිවන අයුරින් කටයුතු කිරීම | (.....) |

(2) පහත සඳහන් ශුද්ධ ලියැවිලි පාඨ ශුද්ධ බයිබලයෙන් උපුටා ගෙන ඔබේ සටහන් පොතේ ලියන්න. එක් එක් පාඨයට අදාළ දේව පනත ද ලියන්න.

i. නික්මයාම 20:12, 20:13, 20:14, 20:15, 20:16, 20:17

ii. ලෙවී ව්‍යවස්ථාව19:11

iii. මතෙව් 5:21

iv. කොලොස්සි 3:20

v. 1 කොරින්ති 6-10, 6:18

vi. එපීස 4:25



**ජීවිතයට බිඳක්**

**දැහැමි ලෙස ජීවත් වන්න.**


නොමිලේ බෙදහැරීම සඳහා ය.